**බේරුවල නගර සභාව**

**------------------------------**

**කළුතර දිස්ත්‍රික්කය**

**--------------------**

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 13 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට බේරුවල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------ | ---------------------- |
| (i) | පෙර වර්ෂ වලට අදාල මුද්දර ගාස්තු ඌන බිල් කිරීම් රු.7,233,655 ක් වුවත් රු.7,348,920 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් මුද්දර ගාස්තු හා සමුච්චිත අරමුදල් ගිණුම්වල ශේෂයන් රු.115,265 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ii) | ප්‍රතිපූර්ණය නොවූ රු.312,896 ක දේපල ණය පොලි සඳහා සමාලෝචිත වර්ෂයේ ණයගැති ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (iii) | භෞතික සැලසුම් වැඩ සටහනේ ප්‍රාග්ධන වියදම් රු.278,295 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (vi) | වටිනාකම ලෙස භෞතික තොගය ගිණුම්ගත කිරීම වෙනුවට රු.5,039,404 ක් වූ පොත් අගය ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.66,135,867 ක් ගිණුම් විෂයයන් 06 කට අදාල ශේෂයන් හා ඒවාට අදාල උප ලේඛන වල දැක්වෙන ශේෂයන් අතර රු.6,834,413 ක වෙනසක් විය. | අදාල ශේෂ වල වෙනස් කම් සසඳා ගිණුම් නිවැරදි කිරිමට කටයුතු කල යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරන බව දන්වමි. |
| (ii) ස්ථාවර වත්කම් ගිණුම්වල ශේෂය හා ප්‍රාග්ධනයට ආදායමින් හා ආධාර මඟින් දායකවීමේ ගිණුම්වල ශේෂ අතර රු.271,702 ක වෙනසක් විය. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ඇ) අවිනිශ්චිත ගිණුම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ රු.541,015 ක බැර ශේෂයක් තිබුණු අතර , එය හඳුනාගෙන නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුය. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරන බව දන්වමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛන හා විස්තරාත්මක උපලේඛන නොමැති වීම නිසා රු.72,383,152 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරිමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරන බව දන්වමි. |

1.4 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | | |
| | (i) මුදල් රෙගුලාසි 371(2)(ඇ) | 396,000 | අවස්ථා 13 දී නිලධාරින් 05 ක් සඳහා දෙන ලද තත්කාර්ය අත්තිකාරම් පියවා නොතිබුණි. | අදාල කාර්යය නිමවූ විගස අත්තිකාරම් පියවිය යුතුය. | ඉදිරියේදී නිවැරදිව කටයුතු කරන බව දන්වමි. |
| | (ii) මුදල් රෙගුලාසි 571(1)(2) | 11,427,589 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී ආදායමට ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 | | වාහන 07 ක මයිලෝ මීටර් නොමැති වීමෙන් ඉන්ධන දහනය පරික්ෂා කර නොතිබුණි. | මයිලෝ මීටර් සවි කර ඉන්ධන දහනය පරික්ෂා කල යුතුය. | මයිලෝ මීටරය නොමැති වාහන සඳහා මයිලෝ මීටර සවි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.6,740,072 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.33,233,072 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 16,461,500 | 17,169,637 | 16,109,093 | 17,958,303 | 16,336,400 | 16,908,314 | 10,531,001 | 19,668,035 |
| (ii) | කුලී | 21,847,100 | 18,125,671 | 18,455,085 | 5,909,262 | 19,870,600 | 11,149,153 | 8,971,404 | 2,177,749 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 693,100 | 404,000 | 883,137 | 153,950 | 510,000 | 216,755 | 216,755 | - |
| (iv) | වෙනත් ආදායම් | 13,454,100 | 10,000,000 | 3,264,095 | 10,000,000 | 210,000 | 125,875 | 125,875 | - |
| | | 52,455,800 | 45,699,308 | 38,711,410 | 34,021,515 | 36,927,000 | 28,400,097 | 19,845,035 | 21,845,784 |

## 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

### (අ) තානායම් කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාල තානායම් කුලිය රු.593,141 ක් වු අතර 2019 දෙසැම්බර් 31 දිනට ඉන් රු.247,143 ක් හෙවත් සියයට 42 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ කුලී කඩිනමින් අයකර ගත යුතුය. | හිඟ මුදල් ගෙවන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය දැනුවත් කර ඇති බව දන්වමි. |

### (ආ) ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික සමීක්ෂණයක් මගින් ගාස්තු අයවිය යුතු ප්‍රචාරක දැන්වීම් පුවරු හඳුනාගැනීමක් සිදු නොකර ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු ලෙස රු.210,000 ක් වාර්ෂිකව බිල් කර තිබුණ ද 2019 දෙසැම්බර් 31 වන විට රු.153,950 ක් හෙවත් සියයට 73 ක් අයවී නොතිබුණි. | හිඟ ගාස්තු කඩිනමින් අයකර ගත යුතුය. | 2020 ජුලි 17 දිනට අයවිය යුතු ශේෂය රු.144,250 ක් බවත්, එය අය කිරීමට කටයුතු කර ඇති බව දන්වමි. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු ආදායම රු.10,000,000 ක් විය. | හිඟ ආදායම් අයකල යුතුය. | උපලේඛන සකස් කර ආදායම් ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

2.3 අධිභාර මුදල් ගෙවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (ආ) සභාවේ සේවයේ නියුතුව සිටින සේවකයෙකු වෙනුවෙන් 2006 මැයි මාසයේ සිට 2015 අගෝස්තු මාසය දක්වා සේවක අර්ථසාධක දායක මුදල් නොගෙවීම හේතුවෙන් රු.211,800 ක් වු මුළු හිඟ දායක මුදල් හා රු.105,900 ක්වු අධිභාර මුදලක් ගෙවීමට සිදු වී තිබුණි. ගෙවන ලද අධිභාර මුදල හා සේවකයාගෙන් අයවිය යුතු රු.84,720 ක්ද , ඇතුළුව සභාවට සිදු වු රු.190,620 ක පාඩුව වගකිව යුතු නිලධාරින්ගෙන් අය කිරිමට කටයුතු කර නොතිබුණි. | සභාවට සිදුවූ පාඩුව අදාල නිලධාරින්ගෙන් අයකල යුතුය. | සභා අනුමැතිය මත අදාල මුදල් ගෙවු බව දන්වමි. |

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) අතුරු ව්‍යවස්ථා | | |
| නගර සභා පනතේ 157 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 15 ක් ඉටු කිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබු නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 5 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුය. | අතුරු ව්‍යවස්ථා 14 ක් වැළඳගෙන ඇති බව දන්වමි.. |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

| | | |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම තුල ක්‍රියාකාරකම් ඉටු කිරිමේ ප්‍රගතිය මැන බැලීමේ ක්‍රම වේදයක් නොතිබුණි. | ක්‍රියාකාරකම් ඉටු කිරිමේ ප්‍රගතිය මැන බැලිය යුතුය. | 2020 වර්ෂයේදී ඉටු කිරිමට කටයුතු කරන බව දන්වමි. |

(ඇ) ප්‍රතිපාදන නොසැලසීම

| | | |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම තුළ ව්‍යාපෘති 27 ක් වෙනුවෙන් රු.මි.23.35 ක් ඇස්තමේන්තු කර තිබුණද භෞතික සැලසුම් වැඩසටහන් යටතේ රු.මි.11.85 ක් වෙනුවෙන් වාර්ෂික අයවැය ප්‍රතිපාදන සලසා නොතිබුණි. | වාර්ෂික අයවැය ලේඛනයට අනුව ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කල යුතුය. | 2020 වර්ෂයේදී ඉටු කිරිමට කටයුතු කරන බව දන්වමි. |

(ඈ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| | | |
|---|---|---|
| කසළ බදු පැනවීම , කොම්පොස්ට් නිෂ්පාදනය හා වාණිජ වටිනාකමක් ඇති කසළ අලෙවි කිරීම වැනි ක්‍රම මගින් ආදායම් උපයා ගත හැකිව තිබියදී එකී අවස්ථා නොසලකා හැර තිබුණි. තවද කසළ බැහැර කරන ස්ථානය සඳහා පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණු අතර එම ස්ථානය ආසන්නයේ අනවසර පදිංචිකරුවන් සිටීම හා දුගඳ හැමීම , මැස්සන් බෝවීම වැනි පාරිසරික ගැටළු මතු වී තිබුණි. | කසළ කළමනාකරණය විධිමත්ව කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුය. | නගර සභා බල ප්‍රදේශය තුල කසල බැහැර කිරිම සඳහා විධිමත් ඉඩමක් සොයා ගැනීමේ ගැටළුවක් පවතින බව හා දැනට භාවිතා කරන ඉඩමේ ගැටළු රාශියක් පවතින බව දන්වමි. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

| | | |
|---|---|---|
| සභාව විසින් තිරසර සංවර්ධන ඉලක්ක 05 ක් හඳුනාගෙන තිබුණ අතර සමාලෝචිත වර්ෂයේදී තිරසර අරමුණක් වූ කාන්තාවන් සවිබල ගැන්වීමේ වැඩ සටහනක් යටතේ කාන්තාවන් 30 දෙනෙකු සඳහා මැහුම් පාඨමාලාවක් සහ භෞතික සැලසුම් මංමාවත් හා යටිතල පහසුකම් සැපයීම් යන කාර්යභාරයන් ඉටු කල බව වාර්ෂික කාර්ය සාධන වාර්තාවේ දක්වා තිබුණි. | හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා උචිත ක්‍රියා මාර්ග වර්ෂය තුල ක්‍රියාත්මක කල යුතුය. | තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාවට නැංවීම සඳහා අයවැය ලේඛනයේ ප්‍රතිපාදන සලසා තිබූ බව හා සමහර ඉලක්කයන් ක්‍රියාවට නැංවීමේදී ගැටළුකාරි තත්ත්වයක් මතු වූ බව දන්වමි. |

3.2 මානව සම්පත් කළමනාකරණය

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ගණකාධිකාරි හා පරිපාලන නිලධාරි තනතුරු පුරප්පාඩු වී පැවති අතර ලේකම් තනතුරේ වැඩ බැලීම සඳහා කළමනාකරණ සේවා අධි ශ්‍රේණියේ නිලධාරියෙකු පත් කර තිබුණි. | අත්‍යවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළ යුතුය. | පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර ඇත. |

| | | |
|---|---|---|
| (ii) අනුමත කාර්ය මණ්ඩලයේ පුස්තකාලයාධිපති තනතුරක , ආදායම් පරික්ෂක තනතුරු 03 ක හා වැඩ පරික්ෂක තනතුරු 02 ක පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුය. | පුස්තකාලයාධිපති තනතුර සඳහා බඳවා ගැනිමෙන් පසු පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බවත්, ආදායම් පරීක්ෂක හා වැඩ පරික්ෂක තනතුරු බඳවා ගැනීම් තාවකාලිකව නවතා ඇති බවත් දන්වා ඇත. |
| (iii) 2012 වර්ෂයේ සිට පෙර පාසැලක් පවත්වාගෙන ගියද අනුමත කාර්ය මණ්ඩලයට පෙර පාසැල් ගුරු හා සහායක තනතුරු ඇතුලත් කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | කාර්යය මණ්ඩලය අනුමත කර ගත යුතුවේ. | අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කරන ලෙස ඉල්ලීමක් කර ඇති බව දන්වමි. |
| (iv) ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලය තුල සේවක පුරප්පාඩු 07 ක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුය. | සියළු බඳවා ගැනීම් 2019 නොවැම්බර් 21 දින සිට අත්හිටුවවා ඇති බව දන්වමි. |

(ආ) සේවක ණය

| | | |
|---|---|---|
| අයවිය යුතු සේවක ණය තුල වර්ෂ 10 ඉක්ම වූ රු.91,428 ක ණය ශේෂයක් විය. | හිග ණය ශේෂ අයකර ගත යුතුය. | ගිණුම් කාරක සභාවේ නියෝග පරිදි ණය කපා හැරීම සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත ඉල්ලීම් කර ඇති බව දන්වමි. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂය සඳහා මස්කඩ බදුදී කුලිය රු.880,700 ක් අය කර ගත යුතුව පැවතුණි. | හිඟ කුලී අප්‍රමාදව අයකල යුතුය. | හිඟ කුලී අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියා මාර්ග ගෙන ඇති බව දන්වමි. |

## 3.4 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බේරුවල නගර සභාවේ ලේකම් තනතුරේ රාජකාරි ඉටු කිරිම සඳහා පත් කරන ලද මතුගම ප්‍රාදේශිය සභාවේ ලේකම් වරයා වෙත 2019 මැයි 01 දින සිට 2019 සැප්තැම්බර් මාසය දක්වා රාජකාරි ඉටු කිරිමේ | වැඩිපුර ගෙවා ඇති මුදල් අය කල යුතුය. | වැඩිපුර ගෙවන ලද මුදල් අයකර ඇති බව දන්වමි. |

දීමනා ලෙස රු.204,495 ක් ගෙවා තිබුණි. ආයතන සංග්‍රහයේ vii පරිච්ඡේදයේ 12.3 ඡේදය ප්‍රකාරව තනතුරක රාජකාරි ඉටු කිරීමට පත් කරනු ලබන නිලධාරියෙකුට ගෙවිය යුත්තේ ඔහු එම තනතුරට වැඩ බැලීමට පත් කරනු ලැබී නම් ඔහුට ලැබෙන අතිරේක පාරිශ්‍රමිකයෙන් තුනෙන් දෙකක ප්‍රමාණයක් පමණක් වුවත්, ඊට පටහැනිව රු153,930 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

### 3.5 වත්කම් කළමනාකරණය

#### 3.5.1 නිශ්ක්‍රිය /ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.3,294,940 ක් වැය කර ඉදිකර තිබූ මරදාන කායවර්ධන මධ්‍යස්ථානය හා එහි ඇති කායවර්ධන උපකරණ වසර දෙකකට ආසන්න කාලයක් කිසිදු කාර්යයකට යොදා නොගෙන නිශ්ක්‍රියව පැවතුනි. | ප්‍රදේශයේ ජනතාවගේ උපයෝජනය සඳහා යෙදවිය යුතුය. | මැතිවරණ සමය පසුවී විවෘත කිරීමට කටයුතු කරන බව දන්වමි. |

#### 3.5.2 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2013 වර්ෂයේ සිට භාවිතයෙන් ඉවත් කල වාහන 07 ක් හා ට්‍රේලර් 05 ක් අපහරනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අපහරණය කිරීමට අදාල කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |

### 3.6 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ මාර්ගවල ගලින් නිම කරන ලද නාම පුවරු 128 ක් සවි කිරීමේ කොන්ත්‍රාත්තුව මාස 06 ක් තුළ නිම කර නොතිබුණු අතර සභාව මිලදී ගෙන තිබූ රු.760,000 වටිනා නාම පුවරු 38 ක් 2020 ජුලි මාසය වන විටත් සවි කිරීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් නාම පුවරු සවිකිරීම සිදු කල යුතුය. | මේ වන විට නාම පුවරු 90 ක් සවිකර ඇති බවත්, ඉතිරි ඒවා සවි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

3.7 නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන පිලිබඳව මාගේ වාර්තාවේ 1.4.1 (අ) , (ආ) , (ඇ) , (ඉ) ඡේද වලට අදාල නිරීක්ෂණ නිවැරදි කර නොතිබුණි. | නිවැරදි කිරිමට කටයුතු කල යුතුය. | ඉදිරියේදී නිවැරදි කරන බව දන්වමි. |